කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2013
(නව නිර්දේශය)
2016 අගෝස්තු - ඔක්තෝබර්

සමාජීයවිද්‍යා පීඨය

සංවර්ධන අධ්‍යයනය - DVST - E 3025

මානව සම්පත් සංවර්ධනය සහ සංවර්ධන අධ්‍යයන පර්යේෂණ විධි

**එක් කොටසකින් ප්‍රශ්න දෙකක්වත් තෝරා ගෙන ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.**

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

## I කොටස - මානව සම්පත් සංවර්ධනය

01. "මානව සංවර්ධනය වනාහි බහුමානීය සංකල්පයකි". විමසන්න.

02. මානව සෞඛ්‍ය සහ යහපැවැත්ම බිඳවැටීමට තුඩු දී ඇති හේතු සාධක මොනවාදැයි නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

03. සංවර්ධනයේ ගෝලීය අසමානතාවයන් හඳුනා ගැනීමට යෝග්‍ය දර්ශකයක් වශයෙන් මානව සංවර්ධන දර්ශකයේ 'Human Development Index (HDI)' වැදගත්කම පරීක්ෂා කරන්න.

04. ශ්‍රී ලංකාවේ ගුණාත්මක මානව සම්පතක් නිර්මාණය කිරීමෙහිලා අවිධිමත් අධ්‍යාපනයෙහි භූමිකාව විග්‍රහ කරන්න.

## 2 කොටස - සංවර්ධන අධ්‍යයන පර්යේෂණ විධි

05. පර්යේෂණ ගැටලුවක් පාදක කර ගනිමින් සාර්ථක පර්යේෂණයක් ගොඩනගා ගන්නා වූ ආකාරය සංවර්ධන අධ්‍යයන විෂයට අදාළ නිදසුනක් ඇසුරින් සැකෙවින් දක්වන්න.

06. ප්‍රාථමික දත්ත ඒකරාශී කිරීම සඳහා යෝග්‍ය ප්‍රශ්නාවලියක් සකස් කර ගැනීමේදී අනුගමනය කළයුතු මූලධර්ම මොනවාදැයි නිදසුන් සහිතව පහදන්න.

07. කෘෂිකාර්මික ජන ජීවිතය නංවාලීමේ උපායමාර්ග සොයා බැලීමේ පර්යේෂණයක නියැළෙන්නේ නම් ඒ සඳහා වූ පර්යේෂණ යෝජනාවක් සකස් කර ගන්නා ආකාරය සංක්ෂිප්තව දක්වන්න.

08. මතු සඳහන් ඒවායින් දෙකකට (02) සංක්ෂිප්ත සටහන් ලියන්න.
   i. ගුණාත්මක පර්යේෂණ (Qualitative Research)
   ii. ප්‍රමාණාත්මක පර්යේෂණ (Quantitative Research)
   iii. ව්‍යවහාරික පර්යේෂණ (Applied Research)
   iv. පාදක පර්යේෂණ (Baseline Research)

*******************